(හයවැනි පාර්ලිමේන්තුව — සිව්වැනි සභාවාරය)

අංක. 42.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2009 නොවැම්බර් මස 17 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0015/'09

1.

ගරු රවි කරුණානායක මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මිහින් එයාර් ගුවන් සේවය සඳහා ආරම්භයේ සිට මේ දක්වා බදු පදනම මත ලබා ගෙන ඇති, මිලට ගෙන ඇති හෝ කුලියට ලබා ගෙන ඇති ගුවන් යානා සංඛ්‍යාව කොපමණද;

(ii) මාසික පදනමින් ගෙවා ඇති හෝ ගෙවනු ලබන මුදල් ප්‍රමාණය කවරේද;

(iii) සමායන මට්ටම පවත්වා ගැනීම සඳහා ප්‍රවාහනය කළ යුතු මගී සංඛ්‍යාව සහ භාණ්ඩ ප්‍රමාණය කොපමණද;

(iv) ගුවන් සේවාව ආරම්භ කරන අවස්ථාවේ සිට ප්‍රවාහනය කළ යුතුව තිබූ මගී සංඛ්‍යාව සහ භාණ්ඩ ප්‍රමාණය මාසික පදනමින් කොපමණද;

(v) සමස්ත ගුවන් භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව සහ අද වන විට ප්‍රවාහනය කර ඇති සමස්ත ගුවන් භාණ්ඩ ප්‍රමාණය මාසික පදනමින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉන්ධන, ගුවන් තොටුපළ හා ගුවන් සේවා කාර්යාල ඉඩකඩ සහ ගබඩා ඉඩකඩ, බදු වර්ග, ගුවන් යානා සඳහා ගෙවිය යුතු ගාස්තු, බැංකු ණය සහ අනෙකුත් විශේෂයෙන් සිදු කළ යුතු ගෙවීම්වලට අදාළව අද දින වන විට ගෙවීමට ඇති මුළු මුදල සහ එම එකිනෙක සඳහා කාලය අනුව ඉදිරිපත් කරන විශ්ලේෂණය කවරේද;

(ii) බඳවා ගත් සමස්ත කාර්ය මණ්ඩලය, ඔවුන්ට මාසිකව ගෙවිය යුතු ප්‍රේෂණවල මුළු වටිනාකම සහ රුපියල් 200,000/- ඉක්මවා වැටුප් ලබන සියලු කාර්ය මණ්ඩල සාමාජිකයන් හට ලබා දෙන වෙනත් වරප්‍රසාද සඳහා මාසිකව වැය කරන මුළු මුදල කොපමණද;

(iii) සේවා ගිවිසුම් මගින් රක්ෂණ ආවරණයක් ලැබී තිබියදීත් ගුවන් යානා කාර්ය මණ්ඩල නඩත්තු රක්ෂණය (ACMI) වෙනුවෙන් ගෙවනු ලබන අමතර ගාස්තුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0084/09

2.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(2)

(අ) (i) 2008 වර්ෂයේ දී පමණක් රජය ණය ලබාගත් මූලාශ්‍ර හා පොලී අනුපාත කවරේද;

(ii) ලබාගත් ණය සඳහා ගිවිසුම්ගත කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2008 වසරේදී පමණක් රජය විසින් ආපසු ගෙවන ලද විදේශ ණය ප්‍රමාණය කොපමණද;

(ii) ආපසු ගෙවන ලද ණය පොලී ප්‍රමාණය කොපමණද;

(iii) ආපසු ගෙවන ලද විදේශ ණය හා පොලී ප්‍රමාණයන් කවර මූලාශ්‍ර මගින් ලබාගත් ණය වෙනුවෙන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0177/'09

3\.

ගරු විජිත රණවීර මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(2)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ අශ්වබල 03 ට අඩු බහුකාර්ය යන්ත්‍ර උපයෝගී කරගනිමින් පවත්වාගෙන යනු ලබන ලියාපදිංචි වඩුමඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම අයගේ නම, ලිපිනය, ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, අදාළ ප්‍රාදේශීය සභාව, ලියාපදිංචි අංකය, ව්‍යාපාරයේ ස්වභාවය සහ ආරම්භ කළ වර්ෂය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අශ්වබල 03ට අඩු බහුකාර්ය යන්ත්‍ර යොදා රැකියාවල නිරතවන වඩු කාර්මිකයන් සියලු දෙනා පරිසර බලපත්‍ර වාර්ෂිකව ලබාගත යුතුද;

(iv) පරිසර බලපත්‍රයක් ලබාගැනීම සඳහා අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙළ හා වැයකළ යුතු සම්පූර්ණ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අශ්වබල 03 ට අඩු බහුකාර්ය යන්ත්‍ර සඳහා පාරිසරික බද්දක් අයකිරීම ආරම්භ කළේ කවදා සිටද;

(ii) 2008 සහ 2009 වර්ෂ සඳහා එම බදු මුදල ගෙවන ලද සංඛ්‍යාව කොපමණද;

(iii) වඩු කාර්මිකයින්ට විශාල වැයබරක් වන මෙම බදු මුදල අහෝසි කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0228/'09

4\.

ගරු පේමසිරි මානගේ මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ඖෂධ මිලදී ගැනීමේ ටෙන්ඩර් ක්‍රියාපරිපාටියෙන් බැහැරව 2005 වර්ෂයේ දී Streptokinase Injection ඒකක 670 ක්, එකක් රුපියල් 5000 බැගින් මිලදී ගත් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ දී Streptokinase Injection ඒකකයක සාමාන්‍ය මිල කොපමණද;

(ii) සිදු වූ පාඩුවේ මුල්‍ය වටිනාකම කොපමණද;

(iii) 2005 වර්ෂයේ දී සිදු වූ මුල්‍ය අක්‍රමිකතාවන්ට වගකිවයුතු පාර්ශ්වයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0572/'09

5.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උතුරුමැද පළාතේ කොපමණ පාසල් සංඛ්‍යාවක් අධ්‍යාපන කටයුතු සඳහා විවෘතව පවතින්නේද;

(ii) විවෘතව පවතින පාසල්වල කොපමණ සංඛ්‍යාවක ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් සිටින්නේද;

(iii) කොපමණ පාසල් සංඛ්‍යාවක වැඩ බලන විදුහල්පතිවරුන් සේවය කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම පළාතේ පාසල්වල විදුහල්පතිවරුන් ලෙස සේවය කිරීම සඳහා කොපමණ විදුහල්පති ශ්‍රේණිධාරීන් සංඛ්‍යාවක් අවශ්‍ය වන්නේද;

(ii) විදුහල්පති ශ්‍රේණියේ I, II සහ III යන පන්තිවලට අයත් විදුහල්පතිවරුන් වෙන වෙනම කොපමණ සංඛ්‍යාවක් සේවයේ යෙදී සිටින්නේද;

(iii) පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) විදුහල්පතිවරුන් ලෙස කටයුතු නොකරන ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(v) මෙම ශ්‍රේණිධාරීන් විදුහල්පතිවරුන් ලෙස පත් කිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0625/'09

6.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත්කර ඇත්තේ කවදා සිටද;

(ii) ඔහුගේ සුදුසුකම් කවරේද;

(iii) ඔහු විසින් මේ දක්වා සිදුකර ඇති විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ වෙනුවෙන් රජයෙන් වැය කළ මුදල කොපමණද;

(v) අදාළ සංචාරවල දී රටට ලබාදුන් ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0726/'09

7.

ගරු එම්.ඩී. නාමල් කරුණාරත්න මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන්සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරිමාර්ග අතරින් හක්වටුනාඔය ව්‍යාපාරය වැදගත් ස්ථානයක් ගන්නා බව එතුමා දන්නෙහිද?

(ආ) මෙම ව්‍යාපාරය මගින් වී වගා කරන බිම් ප්‍රමාණය හා පසුගිය වසර දහය තුළ මුළු බිම් ප්‍රමාණයම වගාකළ කන්න සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) ජලාශය ඉහළ ඇති තේක්ක, යුප්කෙලිප්ටස් හා ඇකේෂියා වැනි විදේශීය වන වගාවන් ඉවත්කර දේශීය වන වගාවන් ආරම්භ කිරීමට පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය සමග එක්ව කටයුතු කරන්නේද;

(ii) වාරිමාර්ග හා ජල කළමනාකරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේදී කඩිනම් කළ යුතු බවට පිළිගත් ජලාශයේ වේලි පද්ධතිය හා ජලාශය ප්‍රතිසංස්කරණය කිරීම කෙදිනක ආරම්භ කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) මෙම ජලාශයේ,—

(i) භූමි ප්‍රමාණය කොපමණද;

(ii) ධාරිතාවය කොපමණද;

(iii) ප්‍රධාන ජල මූලාශ්‍රය කුමක්ද;

(iv) ධාරිතාවයට එම මූලාශ්‍රයේ ජල සැපයුම ප්‍රමාණවත්ද;

(v) ජලාශයේ ජල හිඟයට පිළියමක් වශයෙන් මහවැලි ජලය ලබාදීමට පියවර ගන්නේ නම්, ඒ කවර කාලයක් තුළද;

(vi) නොඑසේ නම්, විකල්ප යෝජනා ක්‍රමයක් ඉදිරිපත් කරන්නේද,

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0773/'09

8\. ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතලේ දිස්ත්‍රික්කයේ, පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හුලංකන්ද-කරඳකැටිය වන රක්ෂිතය කපා හෙළි කර, ජී. පියදාස හා ජී. ගාමිණී තිලකසිරි යන අය විසින් නිවාස ඉදිකිරීමට ගෙබිම සකස්කර අත්තිවාරම් දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඔවුන්ට මෙම වන රක්ෂිතයේ නිවාස ඉදිකිරීම සඳහා අවසර ලබා දුන්නේ කවුරුන් විසින් කවර පදනමක් යටතේද;

(ii) ඔවුන් නීති විරෝධි අන්දමින් මෙම වන රක්ෂිතය හෙළි කර තිබේනම්, ඒ පිළිබඳව ගනු ලබන නීතිමය පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0229/'09

9\. ගරු පේමසිරි මානගේ මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඖෂධ මිල දී ගැනීමේ ටෙන්ඩර් ක්‍රියාපටිපාටියෙන් බැහැරව 2003 වර්ෂයේ දී Spinal Needles ඒකක 1650 ක් මිල දී ගත් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ඒකක එකක් මිල දී ගත් මුදල කොපමණද;

(ii) 2003 වර්ෂයේ දී Spinal Needles ඒකකයක සාමාන්‍ය මිල කොපමණද;

(iii) Spinal Needles මිල දී ගැනීමේ දී සිදු වූ මූල්‍ය අක්‍රමිකතාවය ප්‍රමාණාත්මකව කොපමණද;

(iv) එම මූල්‍ය අක්‍රමිකතාවයට වගකිවයුතු පාර්ශ්වයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0644/'09

10.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— නැවත පදිංචි කිරීම හා ආපදා සහන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උතුරු මානුෂික මෙහෙයුමෙන් පසු අවතැන්ව වව්නියාව සුභසාධන මධ්‍යස්ථානවල ජීවත්වන තුන්ලක්ෂයකට ආසන්න ජනතාවට ප්‍රමාණවත් පහසුකම් නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) වව්නියාව ආශ්‍රිතව පිහිටුවා ඇති සුභසාධන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් මධ්‍යස්ථානවල ජීවත්වන පවුල් හා පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(iii) වව්නියාව ආශ්‍රිතව පිහිටුවා ඇති එම සුභසාධන මධ්‍යස්ථානවල ජීවත්වන තුන්ලක්ෂයකට ආසන්න ජනතාව වෙනුවෙන් රජය ආහාරපාන සඳහා දෛනිකව කොපමණ මුදලක් වැය කරන්නේද;

(iv) ආහාරපාන වලට අමතරව වෙනත් දෛනික පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මධ්‍යස්ථානවල පාලන කටයුතු සඳහා නව කාර්ය මණ්ඩල බඳවා ගෙන තිබේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම සියලු පිරිවැය අදාළ අමාත්‍යාංශය මගින් දරන්නේද;

(iv) නොඑසේ නම්, මේ වෙනුවෙන් පිරිවැය දරන අනෙකුත් ආයතන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0653/'09

11.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂයේ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය යටතේ මූලධන වියදම් ලෙස වාර්ෂික ඇස්තමේන්තු මුදල හා පරිපූරක ඇස්තමේන්තු අනුව වෙන් වූ මුළු මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් වර්ෂය අවසන් වන විට වියදම් කළ මුළු මූලධන වියදම කොපමණද;

(iii) වියදම් නොකර ඉතිරිවූ මුළු මූලධන මුදල කොපමණද;

(iv) වියදම් නොකර ඉතිරිවූ ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා සභාවට ඉදිරිපත් කරන්නේද;

(ආ) ප්‍රයෝජනයට නොගෙන මුදල් ඉතිරිවීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0690/'09

12.

ගරු රවි කරුණානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ දක්වා වූ පසුගිය වසර පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය (ශ්‍රී. ලං. ම. ග. ම) ලැබූ ලාභය / පාඩුව කොපමණද;

(ii) පසුගිය වසර පහක කාලය තුළ ස්ථිර සහ අනියම් පදනමින් සේවය කළ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය වසර පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) බස් ගාස්තු වැඩි කරනු ලැබූ දිනයන් කවරේද;

(ii) ආදායම සහ පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) 2002 සිට 2008 දක්වා සහ 2009 වසරේ මේ දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ සමස්ත ණය ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0765/'09

13.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006, 2007, 2008 සහ 2009 වර්ෂවල පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් ස්ථාන කොපමණ සංඛ්‍යාවක් කඩා බිඳ දමා තිබේද;

(ii) එම ස්ථාන කවරේද;

(iii) ඒ අතුරින් කොපමණ සංඛ්‍යාවක් පොලිසියට වාර්තා වී තිබේද;

(iv) ඒ අනුව අත්අඩංගුවට ගැනීම් කොපමණ සංඛ්‍යාවක් සිදුකර තිබේද;

(v) අදාළ සිද්ධීන් වලින් කොපමණ සංඛ්‍යාවක් සඳහා පුරාවිද්‍යා ආඥා පනත යටතේ නඩු පවරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0774/'09

14.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දඹුල්ල, කුරුණෑගල පාර, ගුරු පවුර, අංක 163 ලිපිනයැති කේ. ඒ. රත්නායක මහතා පදිංචිව සිටි නිවස 2007.12.11 වැනි දින හේමන්ත රෝහන යන අය ඇතුළු මැර පිරිසක් විසින් දැවැන්ත ඩෝසරයකින් කඩා විනාශ කර ඇති බවත්;

(ii) බිරිඳ ඇතුළු දරුවන් නිවසෙන් එළියට ඇද දමා බඩු බාහිරාදිය කඩා බිඳ දමා වෙනත් ඉඩමකට විසිකර ඇති බවත්;

(iii) මේ පිළිබඳව එදිනම දඹුල්ල පොලීසියට පැමිණිලිකර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) බීමත්ව ක්‍රියාකළ මෙම මැර කණ්ඩායම පිළිබඳව මෙතෙක් නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) දැනට අසරණව සිටින මෙම දරු පවුල වෙනුවෙන් සාධාරණය ඉටුකර ඔවුන් ජීවත් වූ නිවස හා බඩු බාහිරාදිය නැවත ලබාදීමට එතුමා පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0661/'09

15.

ගරු ජේමසිරි මානගේ මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් අවසානවරට ලබාගත් ණය ප්‍රමාණය කොපමණද;

(ii) එම ණය මුදල ලබා ගැනීමට ඉල්ලුම් කළේ කවදාද;

(iii) ඉල්ලා සිටි ණය මුදල හා ඊට අදාළ පොලී ප්‍රතිශතය කොපමණද;

(iv) එම ණය මුදල ලබාදීමට අදාළ කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට අප රටේ මුළු විදේශීය ණය ප්‍රමාණය කොපමණද;

(ii) ලබා ගත් ණය යෙදවීමට බලාපොරොත්තු වන්නේ කවර කාර්යයක් සඳහාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තු සේවයේ ස්වාධීන තත්ත්වය ශක්තිමත් කිරීම පිළිබඳ කරුණු සොයා බලා වාර්තා කිරීම පිණිස වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— පාර්ලිමේන්තු සේවයේ ස්වාධීන තත්ත්වය ශක්තිමත් කිරීම පිළිබඳ කරුණු සොයා බලා වාර්තා කිරීම සඳහා 2009 අගෝස්තු මස 06 වැනි දින ගරු කථානායකතුමා විසින් පත් කරන ලද විශේෂ කාරක සභාවට, තමා විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු, පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව මඟින් නියම කර ඇති කාල සීමාව ඇතුළත පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට නොහැකි බැවින්, එම කාරක සභාවට ලබා දී ඇති කාල සීමාව අංක 96 දරන ස්ථාවර නියෝගය ප්‍රකාරව 2010 මාර්තු මස 31 වැනි දින දක්වා දීර්ඝ කළ යුතුය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

මැතිවරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

නැවත පදිංචි කිරීම හා ආපදා සහන සේවා අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 145— වැඩසටහන 02,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන හත්සිය පනහකට (රු. 750,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

ශීර්ෂය 145 — නැවත පදිංචි කිරීම හා ආපදා සහන සේවා අමාත්‍යාංශය

වැඩ සටහන 02 — සංවර්ධන ක්‍රියාකාරකම්

| | | |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | රු. | 750,000,000 |
| | රු. | 750,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 නොවැම්බර් මස 03 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 25 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 24 දක්වා එකතුව රු. 87,606,003,938.

*4.

අපනයන සංවර්ධන හා ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝග,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වැනි වගන්තිය යටතේ අපනයන සංවර්ධන හා ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු අමාත්‍යතුමා විසින් සෙස් බදු සම්බන්ධයෙන් 2009 ජූලි මස 31 වැනි දින පනවන ලදුව, අංක 1612/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ 2009.11.03 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය..

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*5.

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා,— ශාක ආරක්ෂණ පනත යටතේ නියෝග,— 1999 අංක 35 දරන ශාක ආරක්ෂණ පනතේ 12 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2009 ඔක්තෝබර් මස 14 වැනි දිනැති අංක 1623/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ 2009.11.03 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*6.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

ඉන්දියානු ආගාමික කම්කරු (ඉවත්කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

වත්කම්වලින් ආවරණය වූ සුරැකුම්කරණය විධිමත් කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*12.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*13.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජුනි 17) [1]

*14.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*15.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*16.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*17.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*18.

සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*19.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*20.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*21.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*22.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*23.

වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*24.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අංක 6/2006 දරන 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා මාසික වැටුප් පහත සඳහන් පරිදි විය යුතු යැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 70,000/- |
| | රු. 1,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 65,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 63,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු වැටුප් ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*25.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචානාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා, වැටුපෙන් 25%කට සමාන මාසික පෞද්ගලික දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්ට ගෙවිය යුතු පෞද්ගලික දීමනාවක් ලෙස පාර්ලිමේන්තුව විසින් 1998 මාර්තු මස 17 වැනි දින සම්මත කරනු ලැබූ දීමනාවන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පෞද්ගලික දීමනාවන් ක්‍රියාත්මක විය යුතු බව මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*26.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— 2007.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට සහ අභියාචනාධිකරණයේ සභාපතිතුමාට හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට පහත සඳහන් පරිදි මාසික ගෙවල් කුලී දීමනා ගෙවිය යුතු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 27,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 25,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 22,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු ගෙවල් කුලී දීමනාව ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබූ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන ගෙවල් කුලී දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*27.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 4),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, සංග්‍රහ දීමනාව ලෙස මාසිකව රු. 3,500/- ක දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, මෙයට පෙර අගවිනිසුරුවරයා සඳහා පාර්ලිමේන්තුව නිශ්චය කර ඇති සංග්‍රහ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන සංග්‍රහ දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*28.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— දුම්කොළ බදු පනත යටතේ වූ නියෝග,— 1999 අංක 08 දරන දුම්කොළ බදු පනතේ 21 වැනි වගන්තිය යටතේ සිගරට්, සුරුට්ටු, බීඩි හෝ පයිප්ප දුම්කොළ සඳහා වූ අමුද්‍රව්‍ය හෝ නිමි භාණ්ඩ නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම සම්බන්ධයෙන් වැඩබලන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් පනවන ලදුව, 2009 ජුලි මස 17 වැනි දිනැති අංක 1610/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.10. 08 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*29.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥාපනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*30.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥාපනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥාපනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*31.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— වෛද්‍ය ආඥාපනත යටතේ නියෝග,— (105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2009 පෙබරවාරි මස 25 දිනැති අංක 1590/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*32.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදි.)

*33.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදි.)

*34.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2006,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2006.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදි.)

*35.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වාර්ෂික වාර්තාව 2007,— 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*36.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2006,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 40(3) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි මස 01 වැනි දින සිට 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ අතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*37.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2006,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වැනි වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි 01 වැනි දින සිට 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

38.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

39.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

40.

පිළියන්දල ධර්මශාස්ත්‍රෝදය පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

41.

මාතර රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (කොළඹ ශාඛාව) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

42.

කම්කරු නිලධාරීන්ගේ සංගමයේ සුභසාධක අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

43.

ප්‍රේමදාස කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

44.

ශ්‍රී සුමංගල සරණසේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

45.

බලහත්කාරයෙන් ආගම්වලට හරවා ගැනීම තහනම් කිරීමේ පනත් කෙටුම්පත — සලකා බැලීම.

46.

සම් හාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

47.

ශ්‍රී ලංකා කුඩා කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

48.

අල්හාජ් එස්. එම්. එම්. හුසේන් පුණ්‍යාය භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

49.

මහින්දානන්ද අලුත්ගමගේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

50.

ශ්‍රී ලංකා ව්‍යාපෘති කළමනාකරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

51.

සමෝදා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

52.

ග්‍රාස්රූට්ස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**
" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0022/'09

1.

ගරු රවි කරුණානායක මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) මේ දක්වා වූ පසුගිය වසර 4ක කාලය තුළ එක් එක් වර්ෂයේදී, වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය විසින් සහ එම අමාත්‍යාංශයට අයත් ඕනෑම සමාගමක් සඳහා කුලියට ගත් එක් එක් වාහනය වෙනුවෙන් ගෙවන ලද මුළු මුදල හා කුලියට ලබා ගත් කාර්යාලයීය ඉඩකඩ සඳහා ගෙවන ලද මුළු මුදල කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත කාල සීමාව තුළ —

(i) ඉහත කී වාහන සඳහා ඉන්ධන වෙනුවෙන් වැය කළ මුදල කොපමණද හා එම මුදල අමාත්‍යාංශයේ සමස්ත පුනරාවර්තන වියදම් වලින් කුමන ප්‍රතිශතයක්ද;

(ii) ඉහත සඳහන් කාර්යාලයීය ඉඩකඩ සඳහා එක් වර්ග අඩියක් වෙනුවෙන් වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) කල්බදු ක්‍රමය යටතේ එම ගොඩනැගිල්ල ලබා ගෙන ඇත්තේ කොපමණ කාලයක් සඳහාද හා තැන්පතුවක් ලෙස අත්තිකාරම් වශයෙන් ගෙවන ලද මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0121/'09

2.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා සහ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) බස්නාහිර පළාත් සභා මැතිවරණයට අදාළව ස්වාධීන රූපවාහිනියේ දේශපාලන පක්ෂ හා අපේක්ෂකයින්ගේ දැන්වීම් ප්‍රචාරය කළ බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඒ ඒ පක්ෂයේ නම හා පක්ෂය වෙනුවෙන් කුමන ආයතනයක, කුමන පුද්ගලයකු මුදල් ගෙවා තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) තවදුරටත් මුදල් ගෙවීමට නියමිතව ඇති බවට එතුමා දන්නෙහිද?

(ඈ) (i) මෙම මැතිවරණයට අදාළව කවර පක්ෂවලින් කවර අපේක්ෂකයින් දැන්වීම් ප්‍රචාරය කිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කළේද;

(ii) එසේ ඉල්ලා සිටි සියලු අයට ගුවන් කාලය වෙන් කළේද;

(iii) ඒ කවර පදනමක් යටතේද;

(iv) මුදල් ගෙවා හෝ මුදල් ගෙවීමට ගිවිසගෙන දැන්වීම් ප්‍රචාරය කළ අපේක්ෂකයින්ගේ නම්, ලිපිනයන්, ගෙවූ මුදල හා ගෙවීමට ඇති මුදල කොපමණද;

(v) මෙම මැතිවරණයට අදාළව ගිවිසගත් පරිදි මුදල් ගෙවීම පැහැරහැර ඇති පුද්ගලයින්, පක්ෂ හෝ ආයතන කවරේද;

(vi) එම ආයතනවලින් මුදල් අයකර ගැනීමට ගන්නා ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0122/'09

3.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා සහ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වයඹ පළාත් සභා මැතිවරණයට අදාළව ස්වාධීන රූපවාහිනියේ දේශපාලන පක්ෂ හා අපේක්ෂකයින්ගේ දැන්වීම් ප්‍රචාරය කළ බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඒ ඒ පක්ෂයේ නම හා පක්ෂය වෙනුවෙන් කුමන ආයතනයක, කුමන පුද්ගලයකු මුදල් ගෙවා තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) තවදුරටත් මුදල් ගෙවීමට නියමිතව ඇති බව එතුමා දන්නෙහිද?

(ඈ) (i) මෙම මැතිවරණයට අදාළව කවර පක්ෂවලින් කවර අපේක්ෂකයින් දැන්වීම් ප්‍රචාරය කිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කළේද;

(ii) එසේ ඉල්ලා සිටි සියලු අයට ගුවන් කාලය වෙන් කළේද;

(iii) ඒ කවර පදනමක් යටතේද;

(iv) මුදල් ගෙවා හෝ මුදල් ගෙවීමට ගිවිසගෙන දැන්වීම් ප්‍රචාරය කළ අපේක්ෂකයින්ගේ නම්, ලිපිනයන්, ගෙවූ මුදල හා ගෙවීමට ඇති මුදල කොපමණද;

(v) මෙම මැතිවරණයට අදාළව ගිවිසගත් පරිදි මුදල් ගෙවීම පැහැරහැර ඇති පුද්ගලයින්, පක්ෂ හෝ ආයතන කවරේද;

(vi) එම ආයතනවලින් මුදල් අයකර ගැනීමට කවර ක්‍රියා මාර්ග ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0654/'09

4\.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) 2006 වර්ෂයේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය යටතේ මූලධන වියදම් ලෙස වාර්ෂික ඇස්තමේන්තු මුදල හා පරිපූරක ඇස්තමේන්තු අනුව වෙන් වූ මුළු මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් වර්ෂය අවසන් වන විට වියදම් කළ මුළු මූලධන වියදම කොපමණද;

(iii) වියදම් නොකර ඉතිරිවූ මුළු මූලධන මුදල කොපමණද;

(iv) වියදම් නොකර ඉතිරිවූ ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද;

(ආ) ප්‍රයෝජනයට නොගෙන මුදල් ඉතිරිවීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0655/'09

5\.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) 2006 වර්ෂයේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය යටතේ මූලධන වියදම් ලෙස වාර්ෂික ඇස්තමේන්තු මුදල හා පරිපූරක ඇස්තමේන්තු අනුව වෙන් වූ මුළු මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් වර්ෂය අවසන් වන විට වියදම් කළ මුළු මූලධන වියදම කොපමණද;

(iii) වියදම් නොකර ඉතිරි වූ මුළු මූලධන මුදල කොපමණද;

(iv) වියදම් නොකර ඉතිරි වූ ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද;

(ආ) ප්‍රයෝජනයට නොගෙන මුදල් ඉතිරිවීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0657/'09

6\.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) 2007 වර්ෂයේ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය යටතේ මූලධන වියදම් ලෙස වාර්ෂික ඇස්තමේන්තු මුදල හා පරිපූරක ඇස්තමේන්තු අනුව වෙන් වූ මුළු මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් වර්ෂය අවසන් වන විට වියදම් කළ මුළු මූලධන වියදම කොපමණද;

(iii) වියදම් නොකර ඉතිරිවූ මුළු මූලධන මුදල කොපමණද;

(iv) වියදම් නොකර ඉතිරිවූ ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද;

(ආ) ප්‍රයෝජනයට නොගෙන මුදල් ඉතිරිවීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0659/’09

7.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(1)

(අ) (i) 2007 වර්ෂයේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය යටතේ මූලධන වියදම් ලෙස වාර්ෂික ඇස්තමේන්තු මුදල හා පරිපූරක ඇස්තමේන්තු අනුව වෙන් වූ මුළු මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් වර්ෂය අවසන් වන විට වියදම් කළ මුළු මූලධන වියදම කොපමණද;

(iii) වියදම් නොකර ඉතිරිවූ මුළු මූලධන මුදල කොපමණද;

(iv) වියදම් නොකර ඉතිරිවූ ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද;

(ආ) ප්‍රයෝජනයට නොගෙන මුදල් ඉතිරිවීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?